(හත්වැනි පාර්ලිමේන්තුව — පළමුවැනි සභාවාරය)

අංක. 64.]

# පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රය

**2010 දෙසැම්බර් මස 10 වැනි සිකුරාදා පූ. භා. 9.30 ට**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

0237/'10

1.

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) හම්බන්තොට දිස්ත්‍රික්කයේ, තංගල්ල කලාප අධ්‍යාපන කාර්යාලයට අයත්, තංගල්ල කොට්ඨාස අධ්‍යාපන කාර්යාලයෙන් පාලනය වන රජයේ පාසල් සංඛ්‍යාව කොපමණද;

(ii) එම පාසල්වල නම් කවරේද;

(iii) එම පාසල්වලින් දැනට වසා ඇති හෝ වැසීමට තීරණය කර ඇති පාසල් සංඛ්‍යාව කොපමණද;

(iv) එම පාසල්වල නම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මෙම කොට්ඨාසයට අයත් පාසල්වල අතිරික්ත ගුරුවරුන් සිටින්නේද;

(ii) එම පාසල්වල නම් කවරේද;

(iii) ගුරු ඌනතා ඇති පාසල්වල නම් කවරේද;

(iv) ඌනතාවයන් පවතින්නේ කුමන විෂයයන් සඳහාද;

(v) මෙම ගුරු ඌනතා පවතින පාසල් සඳහා ගුරුවරුන් ලබාදීමට කටයුතු කරන්නේද;

(vi) එසේ නම්, ඒ කොපමණ කාලයක් තුළදීද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0560/10

2.

ගරු (අල්හාජ්) ඒ. එච්. එම්. අස්වර් මහතා,— සමුපකාර හා අභ්‍යන්තර වෙළඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ස.තො.ස. ආයතනයේ සිල්ලර ගබඩා පැය 24 පුරා විවෘතව තැබූ කාල සීමාවේදී එම ආයතනය භාරව කටයුතු කළ අමාත්‍යවරයා කවරෙක්ද;

(ii) එම අමාත්‍යවරයාගේ පෞද්ගලික කාර්ය මණ්ඩලය සඳහා ජනාධිපති ලේකම්ගේ අදාළ චක්‍රලේඛය ප්‍රකාරව අනුමත නිලධාරීන් සංඛ්‍යාව සහ ඔවුන්ගේ තනතුරු නාමයන් කවරේද;

(iii) එම තනතුරු හෙබවූ නිලධාරීන්ගේ නම්, ලිපිනයන්, ලැබූ වැටුප් හා දීමනාවන් වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත අමාත්‍යවරයා අමාත්‍ය පදවිය දැරූ කාල සීමාවේදී ඔහුගේ කාර්ය මණ්ඩලය සඳහා එම අමාත්‍යාංශයෙන්, රාජ්‍ය සංස්ථා සහ ව්‍යවස්ථාපිත මණ්ඩලවලින් හා ස.තො.ස වැනි අනුබද්ධ සමාගම්වලින් අනුයුක්ත කරන ලද නිලධාරීන් සංඛ්‍යාව කොපමණද;

(ii) ඔවුන්ගේ නම්, ලිපිනයන්, දැරූ තනතුරු, වැටුප්, දීමනා සහ ලැබූ අනෙකුත් වරප්‍රසාද වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) එම නිලධාරීන් අමාත්‍ය කාර්ය මණ්ඩලයට අනුයුක්ත කිරීමට පෙර සේවය කළ ආයතන හා දැරූ තනතුරු වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0582/'10

3.

ගරු රවී කරුණානායක මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මෙරට ක්‍රියාත්මක වන සියලුම බ්‍රෝඩ්බෑන්ඩ් (පුළුල් තරංග මාලා) සේවා සපයන්නන්ගේ නම් කවරේද;

(ii) එම සමාගම්වල හිමිකරුවන්ගේ සහ අධ්‍යක්ෂවරුන්ගේ නම් කවරේද;

(iii) එම බ්‍රෝඩ්බෑන්ඩ් සේවා සපයන්නන් වෙත ලබාදී ඇති තරංගමාලා සංඛ්‍යාතයන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) බ්‍රෝඩ්බෑන්ඩ් සේවා සපයන කාර්යාලවල සේවය කරන සේවකයන්ගේ සංඛ්‍යාව කවරේද;

(ii) බ්‍රෝඩ්බෑන්ඩ් සේවා සපයන්නන් සිය මෙහෙයුම් ආරම්භ කළ දිනයන් කවරේද;

(iii) පසුගිය වර්ෂ පහක කාලය තුළ එක් එක් වර්ෂයේදී බ්‍රෝඩ්බෑන්ඩ් සේවා සපයන්නන් විසින් ගෙවන ලද බදු මුදල් ප්‍රමාණය කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0609/'10

4.

ගරු මොහාන් ප්‍රියදර්ශන ද සිල්වා මහතා,— දේශීය වෛද්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 2008 හා 2009 වර්ෂවලදී දේශීය වෛද්‍ය අවශ්‍යතාවය අනුව මෙරටට ආනයනය කරන ලද ඖෂධ පැළෑටි වර්ග සංඛ්‍යාව කොපමණද;

(ii) එම ඖෂධ පැළෑටි ආනයනය සඳහා ඉහත වර්ෂවලදී දැරූ මුළු වියදම කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) එම ඖෂධ පැළෑටි මෙරට වගා කිරීම සඳහා ක්‍රියාත්මක වැඩ පිළිවෙළක් තිබේද;

(ii) එසේ නම්, අදාළ ව්‍යාපෘති සඳහා මේවන විට වැය කර ඇති මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0697/'10

5\.

ගරු බුද්ධික පතිරණ මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) ගොවි ජනතාවගේ ජීවන තත්වය සුරක්ෂිත කිරීම සඳහා ක්‍රියාත්මක කර ඇති ගොවි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳව එතුමා දන්නෙහිද?

(ආ) (i) දැනට ගොවි විශ්‍රාම වැටුප් ලබන පුද්ගලයින් සංඛ්‍යාව කොපමණද;

(ii) ගොවි ජනතාව ගොවි විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක කර ගනු ලබන ක්‍රමවේදය කවරේද;

(iii) ගොවි විශ්‍රාම වැටුප වශයෙන් මාසයකට එක් පුද්ගලයෙකුට ලබා දෙන මුදල කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) දැනට ලැබෙන ගොවි විශ්‍රාම වැටුප පවතින ජීවන වියදම් තත්වය අනුව ප්‍රමාණවත් බව එතුමා පිළිගන්නෙහිද?

(ඈ) (i) දැනට ලබා දෙන ගොවි විශ්‍රාම වැටුප වර්තමාන ජීවන වියදම් තත්වයට ගැලපෙන අයුරින් වැඩි කිරීම සඳහා කටයුතු කරන්නේද;

(ii) එසේ නම්, ගොවි විශ්‍රාම වැටුප වැඩි කරනු ලබන මුදල කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

0238/'10

6\.

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) හම්බන්තොට දිස්ත්‍රික්කයේ, හම්බන්තොට කලාප අධ්‍යාපන කාර්යාලයට අයත්, අම්බලන්තොට කොට්ඨාස අධ්‍යාපන කාර්යාලයෙන් පාලනය වන රජයේ පාසල්වල යටිතල පහසුකම් සහ පොදු අවශ්‍යතාවයන්ගේ ඌණතාවයන් පවතින බැව් එතුමා දන්නෙහිද?

(ආ) (i) එම පාසල් පද්ධතිය තුළ ඇති විදුලිය නොමැති පාසල් සංඛ්‍යාව කොපමණද;

(ii) එම පාසල්වල නම් කවරේද;

(iii) එම පාසල් පද්ධතිය තුළ විදුලිය නොමැති ගුරු නිවාස සංඛ්‍යාව කොපමණද;

(iv) ඒවා අයත් පාසල්වල නම් කවරේද;

(v) ලී බඩු අවශ්‍යතා ඇති පාසල් සංඛ්‍යාව කොපමණද;

(vi) එම අවශ්‍යතාවන් කවරේද;

(vii) විද්‍යාගාර සහ පුස්තකාල නොමැති පාසල් සංඛ්‍යාව කොපමණද;

(viii) එම පාසල්වල නම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) (i) ඉහත සඳහන් අවශ්‍යතා ඉටුකරලීමට අවශ්‍ය ප්‍රතිපාදන එම පාසල් සඳහා වෙන් කර දීමට කටයුතු කරන්නේද;

(ii) එසේ නම්, ඒ කොපමණ කාලයක් තුළදීද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0583/'10

7.

ගරු රවී කරුණානායක මහතා,— විදේශ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකා රජය විසින් 2009 සහ 2010 වර්ෂයන්හිදී ලොව පුරා පත් කරන ලද ගරු උපදේශකවරුන් සංඛ්‍යාව කවරේද;

(ii) එවැනි පත්කිරීම් සිදු කරන ලද්දේ කවර රටවල් සඳහාද සහ එම පත්වීම් ලබාදීමට හේතු කවරේද;

(iii) පත්වීම් ලබාදීම මගින් ශ්‍රී ලංකාවට ලැබුණ විශේෂ වාසි කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ගරු උපදේශකවරුන් වශයෙන් නව පත්වීම් ලබාදීමට නියමිත තැනැත්තන් සිටිත්ද;

(ii) එම නව පත් කිරීම් ලබාදීම සඳහා කිසියම් නිර්ණායකයක් තිබේද;

(iii) පසුගිය වර්ෂ 10 තුළ කවර හෝ උපදේශකවරයෙකු ඉවත් කරනු ලැබ තිබේද;

(iv) එසේ නම්, ඔවුන්ගේ නම් සහ එසේ ඉවත් කරනු ලැබීමට හේතු කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

# ප්‍රධාන කටයුතු ආරම්භයේ දී

## යෝජනා පිළිබඳ දැනුම්දීම

1.

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— පාර්ලිමේන්තුවේ කටයුතු (අංක 1),— න්‍යාය පත්‍රයේ ප්‍රධාන කටයුතුවල අංක 3 දරන විෂය පිළිබඳ වැඩ අද දින රැස්වීමේදී අංක 23 දරන ස්ථාවර නියෝගයෙහි විධිවිධානයන්ගෙන් නිදහස් විය යුතු ය.

2.

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— පාර්ලිමේන්තුවේ කටයුතු (අංක 2),— 2010 නොවැම්බර් මස 27 වැනි දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාවන්හි කුමක් සඳහන්ව තිබුනද, න්‍යාය පත්‍රයේ ප්‍රධාන කටයුතුවල අංක 1 සිට 3 දක්වා ඇති විෂයයන් පිළිබඳව වැඩ අද දින රැස්වීමේදී ස්ථාවර නියෝග 7, 70(2) සහ 70(3) හි විධිවිධානයන්ගෙන් නිදහස් විය යුතුය.

3.

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— පාර්ලිමේන්තුවේ රැස්වීම්,— අද දින විසිර යෑමේදී මෙම පාර්ලිමේන්තුව 2011 ජනවාරි මස 04 වැනි අඟහරුවාදා අ.භා. 1.00 වන තෙක් කල් තැබිය යුතුය.

# යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

*අ1.

විසර්ජන පනත් කෙටුම්පත (2011) — (දහසයවැනි වෙන් කළ දිනය) — කාරක සභාව (දෙසැම්බර් 09 වැනි දින ප්‍රගතිය)

*2.

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා,— විසර්ජන පනත යටතේ යෝජනාව,— 2008 අංක 43 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යවරයාට පැවරුන බලතල අනුව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව, වැඩබලන මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යවරයා විසින් දෙන ලද පහත දැක්වෙන අංක 27 දරන නියමය අනුමත කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

## 2008 අංක 43 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ අංක 27 දරන නියමය

වැඩ බලන මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍ය, සරත් අමුණුගම වන මම, 2008 අංක 43 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තියෙන් මා වෙත පවරනු ලැබ ඇති බලතල ප්‍රකාරව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව, එකී පනතේ තෙවැනි උපලේඛනයේ විෂය අංක: 21302 "පොත් මුද්‍රණය, ප්‍රචාරණය හා අලෙවිය අත්තිකාරම් ගිණුම — අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව" වෙත පැවරී ඇති කාර්යය වෙනුවෙන් නිශ්චිතව දක්වා ඇති සීමාවන්, මෙම නියමය මගින් වෙනස් කරමි.

| | | | |
|---|---|---|---|
| (i) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ II වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති වියදමෙහි උපරිම සීමාව | සංශෝධන නොමැත | |
| (ii) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ III වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති ලැබීම්වල අවම සීමාව | රු. 2,400,000,000<br>රු. 2,162,000,000 | සිට<br>දක්වා |
| (iii) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ IV වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති ලැබීම්වල හර ශේෂයන්ගේ උපරිම සීමාව | සංශෝධන නොමැත | |
| (iv) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ V වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති බැරකම්හි උපරිම සීමාව | රු. 100,000,000<br>රු. 960,000,000 | සිට<br>දක්වා |

(මෙම නියමය වලංගු වන්නේ 2009.12.31 වැනි දින දක්වා පමණි)

අත්සන් කළේ/ ආචාර්ය සරත් අමුණුගම,
වැඩ බලන මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමා.

2010.07.03 වැනි දින,
කොළඹ 01.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත)

*3.

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා,— ආනයන හා අපනයන (පාලන) පනත යටතේ නියෝග,— 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනතේ 4 වැනි වගන්තියේ (3) වැනි උපවගන්තිය සහ එකී පනතේ 14 වැනි වගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 20 වැනි වගන්තිය යටතේ ජනාධිපතිවරයා විසින් සාදනු ලැබ 2010 නොවැම්බර් මස 22 වැනි දින අංක 1681/6 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබූ 2010.12.09 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*4.

ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යතුමා,— හිමිකම් ලියාපදිංචි කිරීමේ පනත යටතේ නියෝග,— 1998 අංක 21 දරන හිමිකම් ලියාපදිංචි කිරීමේ පනතේ 60 සහ 62 වැනි වගන්ති සමඟ කියවිය යුතු, එකී පනතේ 67 වැනි වගන්තිය යටතේ ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2009 අගෝස්තු 24 දිනැති, අංක 1616/23 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2010.05.06 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*5.

බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) (සංශෝධන) පනත් කෙටුම්පත— දෙවැනි වර කියවීම

*6.

රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ (සංශෝධන) පනත් කෙටුම්පත— දෙවැනි වර කියවීම

*7.

පළාත් පාලන ආයතන (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත— දෙවැනි වර කියවීම

*8.

පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් (සංශෝධන) පනත් කෙටුම්පත— දෙවැනි වර කියවීම

*9.

පීඩාකාරී ආයුධ (සංශෝධන) පනත් කෙටුම්පත— දෙවැනි වර කියවීම

*10.

සමථ මණ්ඩල (සංශෝධන) පනත් කෙටුම්පත— දෙවැනි වර කියවීම

11.

පින සංවිධානය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත— දෙවැනි වර කියවීම

12.

ශ්‍රී ලංකාවේ සැමට සෙත පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත— දෙවැනි වර කියවීම

13.

මහේෂ්වරී පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත— දෙවැනි වර කියවීම

*** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.**

## දිනට නියමිත කටයුතුවලට අදාළ සංශෝධන පිළිබඳ දැනුම්දීම

අ1.

විසර්ජන පනත් කෙටුම්පත (2011) නැමැති පනත් කෙටුම්පතට කාරක සභාවේදී ඉදිරිපත් කරන සංශෝධන සඳහා වෙනම නිකුත් කළ "දිනට නියමිත කටයුතුවලට අදාළ අතිරේකය" නමැති පත්‍රිකාව බලන්න.